**සේවක අර්ථසාධක අරමුදල - 2019**
**-----------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සේවක අර්ථසාධක අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ලැබීම් ගෙවීම් ගිණුම, ආයෝජන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සේවක අර්ථසාධක අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 42 වන වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂවල වැරදි නිවැරදි කිරීමේ දී පූර්ව වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක සංඛ්‍යා නිවැරදි කිරීම (restate) සිදුකළ යුතු වුවද ඊට පටහැනිව රු.170,391,828 ක් වූ නාමික බදු සහ රඳවාගැනීමේ බදුවලට (Notional tax and withholding tax) අදාල පෙර වර්ෂවල ගැලපීම් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගලපා තිබුණි. | මෙය ගිණුම්කරණ වැරැදි නිවැරැදි කිරිමක් නොවන අතර එය ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීමකි. එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි වගන්ති 34 සිට 40 ප්‍රකාරව නිවැරදිව ගිණුම්ගත කර තිබේ. | නාමික බදු සහ රඳවාගැනීමේ බදුවලට අදාලව වර්ෂය තුලදී නිවැරදි කිරීමක් සිදුකර ඇති නිසා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව පෙර වර්ෂවල වැරදි නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන්ව තිබූ රු. 76,656,104 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | ප්‍රමිතය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර ඒ අනුව ක්ෂය ගැලපීම් කිරීම සිදුකල යුතු වීම. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 07 කට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශවල වසර 18 ක් වූ කාලයක් ඇතුළත අගරු වූ චෙක්පත්, බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු, මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, ඍජු හර/බැර හා හඳුනානොගත් අනෙකුත් ශේෂ ලෙස එකතුව රු.මිලියන 10,764 ක් සහ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුම්, උපලබ්ධි නොවූ චෙක්පත් හා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් එකතුව රු.මිලියන 568 ක් වූ නමුත් මෙම අයිතම හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි පැවති හඳුනා නොගත් ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ නිරවුල් කිරීමේ කටයුතු සිදු කරන අතර මේ වන විට රු මිලියන 5,234 පමණ ප්‍රමාණයක් නිරාකරණය කරන ලදී. බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි පවතින දිගුකාලීන ශේෂයන් නිරවුල් කිරීම සඳහා මුදල් මණ්ඩල අනුමැතිය යටතේ ටෙන්ඩර් පටිපාටියකට අනුකූලව තෝරා ගන්නා ලද Ernst & Young (E&Y) ආයතනයේ සහභාගිත්වය ඇතුව 2020-01-09 දින එම විශේෂ වැඩසටහන ආරම්භ විය. ඒ අනුව බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි පවතින දිගුකාලීන නිරවුල් නොවූ ශේෂ 2021 මුදල් වර්ෂයට පෙර නිරවුල් කරනු ලැබේ. | බැංකු සැසඳුම් ප්‍රකාශවල ඇතුළත් වන අගරු වූ චෙක්පත්, බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු, මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, ඍජු හර/බැර හා හඳුනානොගත් අනෙකුත් බැංකු ශේෂ ආදිය කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට සුදුසු පාලන පද්ධතියක් සකස් කළ යුතු වීම. |
| (ආ) එක් බැංකු ගිණුමකට අදාළ මුදල් පොත අනුව සහ බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 1,681,817,523 ක් වුවද 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී එම ශේෂය රු.1,659,712,768 ක් ලෙස ඇතුළත් කර තිබීම නිසා රු.22,104,755 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | බැංකු ගිණුමට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශනය සෑදීමේදී එතෙක් භාවිත කරන ලද "ගිණුම්කරණ මෘදුකාංගය SAP" තාක්ෂණික කරුණක් මත 2019 මුල් කාර්තුවේදී අක්‍රිය වීම නිසා දත්ත වාර්තා කිරීමේ දී වූ මගහැරීමකින් මෙම වෙනස ඇති වූ අතර, එම වෙනස 2020 වසරේ දී ගැළපීමට කටයුතු කරනු ලැබේ. | මුදල් ශේෂ වැනි මූලික කරුණු මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කිරීමේදී ප්‍රමාණවත් සැලකිල්ලකින් හා අධීක්ෂණයකින් යුතුවීම, හා වෙනස හඳුනාගෙන කඩිනමින් ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සාමාජික අරමුදල තුල ඇතුලත් ගිණුම් 7 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.මිලියන 89,707 ක් වුවද එම ගිණුම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු. මිලියන 64,291 ක් වූයෙන් රු. මිලියන 25,416 ක වෙනසක් නිරීක්ෂණය වූ නමුත් ඒ සඳහා සැසඳුම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොවුණි. | AS/400 පද්ධතිය තුල පවත්වාගෙන යන කේවල සාමාජික ගිණුම් දත්ත ලිපිගොනුවක් හරහා පොදු ලෙජරය වෙත දෛනිකව උඩුගත කර (Upload) පොදු ලෙජරය යාවත්කාලීන කරනු ලැබේ. කේවල ගිණුම් වෙනුවෙන් පාලන ගිණුමක් පොදු ලෙජරය තුල පවත්වාගෙන යනු ලැබේ. AS/400 පද්ධතිය තුල මුදල් පදනමින් ද පොදු ලෙජරය තුල උපචිත පදනමින් ද ගනුදෙනු වාර්තා කරන බැවින් මෙම පද්ධති දෙකෙහි ශේෂයන්ගේ ස්වාභාවික වෙනසක් පවතී. | වෙනස්කම් සම්බන්ධයෙන් සැසඳුම් ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් ඛාණ්ඩ 04 ක 2019 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.918,035,505 ක් වුවද, ක්ෂය වෙන්කිරීම සඳහා වූ උපලේඛනයේ එම පිරිවැය රු.574,401,532 ක් වූ බැවින් රු. 343,633,973 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට ආයතනය කටයුතු කළ යුතු වීම. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| වාහන, ලී බඩු, පරිගණක හා උපාංග සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යන ස්ථාවර වත්කම් භාණ්ඩ 04 සම්බන්ධයෙන් 2009 සිට 2013 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ මිලදී ගැනීම් | 308,804,794 | ස්ථාවර වත්කම් වෙන වෙනම දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛන හා උපලේඛන | පිළිතුර ඉදිරිපත් කර නැත. | මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ශේෂ පිළිබඳව ප්‍රමාණවත් තහවුරු කිරීමේ සාක්ෂි පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 222,776 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 190,617 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 32,159 ක වර්ධනයක් නිරීක්ෂණ විය.

සාමාජිකයින්ගේ දායක මුදල් සම්බන්ධයෙන් 2012 වර්ෂයේ දී සියයට 11.5 ක ප්‍රතිශතයකින් ගෙවන ලද ප්‍රතිලාභ අනුපාතය 2014 වර්ෂය වන විට සියයට 10.5 දක්වා පහළ ගොස් තිබුණි. 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නොකඩවා එම අනුපාතය පවත්වාගෙන ගොස් තිබුණු අතර 2019 වර්ෂයේදී එම අනුපාතය සියයට 9.25 දක්වා පහළ ගොස් තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සාමාජිකයන්ට තම ගිණුමේ ශේෂය පිරික්සීම සඳහා KIOSK යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ලංකාව පුරා පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාල 30 ක ස්ථාපිත කර තිබූ KIOSK යන්ත්‍ර සම්බන්ධයෙන් 2019 වර්ෂයේ දී සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී යන්ත්‍ර 27 ක් අක්‍රීයව පැවති | 2018 දෙසැම්බර් 31 දින පරීක්ෂාවේ දී යන්ත්‍ර 20 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. යන්ත්‍ර බොහෝමයක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර වර්ෂ 05 කට අධික කාලයක් | සාමාජික අරමුදලින් වියදම් දැරීමේ දී කාර්යක්ෂමව ඵලදායීව හා සකසුරුවම් ලෙස කටයුතු කිරීම ආයතනයේ වගකීම වේ. |

| | |
|---|---|
| අතර ඉන් යන්ත්‍ර 5 ක් සවි කරන ලද මුල් කාලයේ සිටම විවිධ හේතු මත අක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය. මෙම යන්ත්‍ර සවිකරන ලද ආයතනය විසින් බොහෝ වාර ගණනක් අලුත්වැඩියා කර තිබුණද නිතරම අක්‍රීය වීම හේතුවෙන් සාමාජිකයන්ට තම ශේෂය විමසීමට නොහැකි වී තිබුණි. නිවැරදි ඇගයීම් ක්‍රියාවලියකින් තොරව මිලදීගෙන තිබීම, යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මාර්ගෝපදේශයන් (user manual) හා විධිමත් පුහුණුවක් ලබාදී නොතිබීම, අඛණ්ඩව ප්‍රගතිය ඇගයීමක් සිදු නොකිරීම, යන්ත්‍රවල භාරකාරිත්වය හා වගකීම නිසි අධිකාරියකට පවරා නොතිබීම සහ නිවැරදි ස්ථාන වල සවිකර නොතිබීම (නැවත ලියාපදිංචි කර ඇති සාමාජික සංඛ්‍යාව සලකා බලා නොතිබීම) යනාදි කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අසාර්ථක වී තිබුණි. එසේම සවිකරන ලද දින සිට වර්ෂ 5 ක්වත් ගතවීමට පෙර මෙලෙස යන්ත්‍ර භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම අරමුදලට අලාභයක් වී තිබුණි. | ගතවී ඇති බැවින් එම යන්ත්‍ර වල ඵලදායී ජීවිතකාලය සමාලෝචනය කර ක්ෂය ගැලපීම කිරීමට කටයුතු කළ යුතු බව සඳහන් කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සාමාජිකයන් ලෙස පෙනී සිටිමින් ව්‍යාජ පුද්ගලයන් විසින් ප්‍රතිලාභ මුදල් නිදහස් කරගෙන තිබූ අවස්ථා 64 ක් හඳුනාගෙන තිබුණි. එයින් අවස්ථා 61 ක් වෙනුවෙන් 2004 නොවැම්බර් 04 සිට 2020 පෙබරවාරි 20 දක්වා අරමුදලට වැය බරක් වන ලෙස රු. 52,316,484 ක් ගෙවා තිබූ අතර අවස්ථා 3 කට අදාළව රු.3,393,727 ක මුදලක් තවදුරටත් ගෙවීමට පැවතුණි. එම අවස්ථා සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට හා අභ්‍යන්තර නිලධාරීන්ගේ විෂමාචාරයක් සිදුවී ඇති බවට කරුණු අනාවරණය වුවහොත් ඔවුනට විරුද්ධව නීත්‍යානුකූලව ක්‍රියාමාර්ග ගැනීමට අරමුදල කටයුතු කර නොතිබුණි. | වංචා සහගත ප්‍රතිලාභ ගෙවීම් පිළිබඳ තොරතුරු අනාවරණය වනුයේ සත්‍ය සාමාජිකයා ප්‍රතිලාභ අයදුම්කරන අවස්ථාවේ දී වන අතර ඒ වන විට අදාළ ගෙවීම් සිදුකර බොහෝ කාලයක් ගතවී ඇති බැවින් ඒ අවස්ථාවේ අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කිරීම ප්‍රායෝගික වශයෙන් අසාර්ථක වුවද ඉදිරියේ දී වංචා සහගත ගෙවීම් සම්බන්ධයෙන් ඒවා හඳුනාගත් අවස්ථාවේම අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. | වංචා සහගත ගෙවීම් සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පරීක්ෂණ පවත්වා අභ්‍යන්තර නිලධාරීන්ගේ විෂමාචාරයක් සිදු වී තිබේ ද යන්න අනාවරණය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) 2008 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කර තිබුණු අන්තර්ජාලය හරහා ගිණුම් ශේෂය පිරික්සීමේ පහසුකම සම්බන්ධයෙන් විධිමත් පරිදි ප්‍රචාරණ කටයුතු සිදු නොකිරීම හේතුවෙන් එම ක්‍රමය සාමාජිකයන් අතර ජනප්‍රිය වී නොතිබුණි. එසේම කම්කරු දෙපාර්තමේන්තුව විසින් සාමාජිකයන්ගේ ගිණුම් ශේෂය පිරික්සීම සඳහා සවිකරන ලද KIOSK යන්ත්‍ර ද වැඩි ප්‍රමාණයක් අක්‍රියව පැවතීමෙන් එම යන්ත්‍ර භාවිතයෙන් ගිණුම් ශේෂය දැනගැනීමේ පහසුකම ද අපේක්ෂා කල පරිදි සාමාජිකයන්ට ලැබී නොතිබුණි. ඒ අනුව මිලියන 2.6 ක් පමණ වන සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයන්ට තම ගිණුම් ශේෂය විමසීමට කඩිනම් හා පහසු ක්‍රමයක් ස්ථාපිත කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | තැපැල් මගින් හා ඉලෙක්ට්‍රොනික් තැපැල මගින් ඉල්ලුම් කිරිම, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැමිණ විමසීම, බාගත ශේෂ විමසුම් සේවාවේ ලියාපදිංචිය වීම මගින් ජංගම දුරකථන කෙටි පණිවිඩ ඔස්සේ විමසීම යනාදී ක්‍රම මගින් දැනට ගිණුමේ ශේෂය පරීක්ෂාකර ගත හැකි වේ. කේවල සාමාජික ගිණුම්වලට මුදල් බැරකර කෙටි පණිවිඩ යැවීම හා මංගත ශේෂ විමසුම් සේවාව සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වැඩිදියුණු කිරිම යනාදී ව්‍යාපෘති මේ වනවිට ක්‍රියාත්මක කරමින් පවතී. | සාමාජිකයන්ට තම ගිණුමේ ශේෂය විමසීමට කඩිනම් හා පහසු ක්‍රමයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ සාමාජික අරමුදල තුල ඇති කම්කරු කොමසාරිස් ගිණුමේ සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකරගෙන තිබූ 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10,711 ක් වූ මුදල සහ එසේ නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තුරු පොදු තැන්පත් ගිණුමක රඳවා තිබූ රු.මිලියන 398 ක් වූ මුදල එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සේවායෝජකයින්ගේ නමින් වෙන් වෙන්ව පවත්වාගෙන යනු ලබන "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" නමින් වූ ගිණුමේ 2019 දෙසැම්බර් 31 දිනට වසර ඉක්මවූ රු. මිලියන 30,435 ක ශේෂයක් අදාළ සාමාජිකයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2019 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් රු. මිලියන 860 ක් ද ඌන/අතිරික්ත දායක මුදල් වශයෙන් රු.මිලියන 1,843 ක් ද ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් රු. මිලියන 784 ක් ද සාමාජික අරමුදල යටතේ දක්වා තිබුණද එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | “සී” වාර්තාවල අඩුපාඩු, සාමාජිකයන්ගේ බැංකු ගිණුම් තොරතුරු දෝෂ සහිත වීම, නඩු අංක නිවැරදිව හඳුනාගත නොහැකි වීම යනාදි හේතු නිසා අදාළ ශේෂ නිරවුල් කිරීමට නොහැකිව පවතී. අඩුවැඩි දායක මුදල් ගිණුමට අදාළව නිවැරදි තොරතුරු ලද පසු නිරාකරණය කළ හැකිය. | නිරවුල් කර නොමැති දායක මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමට කාර්යක්ෂම වැඩපිළිවෙලක් සකස් කිරීමට ආයතනය කටයුතු කළ යුතු වීම. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සාමාජිකයන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබූ ඡායාරූප හා ඇඟිලි සලකුණු ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේදී මිලදීගෙන තිබුණු Quick Cam Camera 12ක්,2019 වර්ෂයේදී රු.1,725,375 ක් වැයකර මිලදීගෙන තිබූ Quick Cam Camera 50 ක් හා 2018 වර්ෂයේදී රු. 3,261,600 ක් වැය කර මිලදීගෙන තිබූ Laptop පරිගණක 24 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට බෙදානොහැර ගබඩාවේ නිශ්ක්‍රියව පැවතුණි. | කලාප කාර්යාලවල දැනට පවතින Quick cam Camera අක්‍රිය වන විට ඒ වෙනුවට ප්‍රතිස්ථාපනය කිරීම සඳහා 5 ක් තබා ඇති අතර තවත් Camera 7 ක් ඉතිරිව පවතී. ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දී Laptop පරිගණක පමණක්ද 2019 වර්ෂයේ දී Quick Cam Camera පමණක් ද මිලදී ගත් බැවින් එම උපාංග කට්ටල වශයෙන් සකස් කිරීමේ හැකියාවක් නොතිබුණි. | නිසි අවශ්‍යතා හඳුනාගැනීමෙන් අනතුරුව වත්කම් මිලදීගත යුතු අතර ඒවා කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |